**ශීර්ෂය 130- රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**-----------------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 11 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 16 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 ආදායම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශයට අයත් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතය යටතට සියලුම රජයේ ගොඩනැගිලිවලින් අයවිය යුතු නිවාස කුලිය, සංචාරක බංගලා/ නිවාඩු නිකේතන/ වානිජ ගොඩනැගිලි/ ගබඩා සහ වෙනත් ගොඩනැගිලිවලින් ලැබෙන ආදායමින් සමන්විත විය යුතු වුවද, වැටුපෙන් අයකර ගන්නා නිවාස කුලී පමණක් මෙම ආදායම් සංකේතයට බැර කර තිබුණි. එසේ වුවද සංචාරක බංගලා/ නිවාඩු නිකේතන, ආපන ශාලා කුලී, ශ්‍රවනාගාර කුලී ආදිය වෙනත් ආදායම් සංකේතවලට බැර කරන බව දෙපාර්තමේන්තු 05 ක සිදු කරන ලද නියැදි පරීක්ෂාවට අනුව අනාවරණය විය. මෙම හේතුවෙන් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් හා හිඟ ආදායම්වල සත්‍ය අගයන් ආදායම් ගිණුමෙන් නිරූපණය නොවූ බැවින් ආදායම් රැස් කිරීමේ ගණන් දීමේ නිළධාරී ලෙස තම ආදායම සම්බන්ධයෙන් පසුවිපරම් කර තිබූ බවක් විගණනයේදී අනාවරණය නොවුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අදාල ආයතන විසින් මාසිකව එවනු ලබන මාසික ආදායම් සාරාංශය මඟින් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී වලට අදාල ආදායම් කාණ්ඩවලට ආදායම බැර කර ඇති බව නිරීක්ෂණය වන අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැර සියලු ආයතන ඉහත සඳහන් ආදායම් කාණ්ඩ වලට අදාල සියලු ආදායම්, ආදායම් සංකේතාංකයට බැර කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් අප කළ උපදෙස් විමසීමට අනුව එම දෙපාර්තමේන්තුව විසින් විස්තරාත්මක වාර්තාවක් එවන ලෙස වනජීවී සංරක්ෂණ | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පමණක් නොව තවත් ආයතන විසින් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතයට යා යුතු ආදායම් එම සංකේතයට බැර නොකරන බැවින් එම ආදායම් මෙම ආදායම් සංකේතයට බැර කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් දෙනු ලබන උපදෙස් අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ආ) | ආදායම් ශීර්ෂය යටතේ ගැනෙන ගොඩනැගිලි සඳහා අය කරනු ලබන කුලී වටිනාකම් කොපමණද යන්න හඳුනා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් දත්ත පද්ධතියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. ආදායම් සංකේතාංක 20.02.01.01 හි ආදායම් ගණන් දීමේ නිලධාරී වශයෙන් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් රැස්කරනු ලබන සියලු ආයතන ඇතුලත් වන පරිදි දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම ප්‍රායෝගික වශයෙන් අපහසුය. කෙසේ වෙතත් දත්ත පද්ධතිය සමග රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී වලට අදාල විස්තර ලබාගත හැකි පරිදි මෘදුකාංගයක් සකස් කිරීම සඳහා අප අමාත්‍යාංශය විසින් මූලික පියවර ගෙන ඇති අතර හැකි ඉක්මනින් රජයට අයත් ආදායම් ලබන ගොඩනැගිලි සියල්ලම දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලබයි. | දත්ත පද්ධතියක් සකස් කර ගොඩනැගිලි ආදායම නිවැරදිව එකතු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ආදායම් නිවැරදිව පුරෝකතනය | නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2020 විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත | චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් නිවැරදිව පුරෝකථනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතුයි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව හා ශුද්ධ ආදායම රැස් කිරීම අතර රු.64,574,426 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. | කිරීම ප්‍රමාදවීම හේතුවෙන් මූලික ඇස්තමේන්තුව සඳහා අනුමැතිය කොපමණද යන්න දැන ගැනීමට නොහැකි වීමෙන් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට නොහැකි වූ අතර සියයට 5.87 කින් ආදායම වැඩිපුර එකතු කර ඇත. | |
| (ඇ) | 2020 ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.252,088,986 ක් වූ අතර, එයට සමාලෝචිත වර්ෂයේ දී හිඟ ආදායම් ලෙස රු.85,859,486 ක් එකතු වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.39,107,705 කින් හිඟ ආදායම වැඩි වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායමෙන් අයවීම රු.30,947,381 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම වැඩිවීමට Covid -19 වසංගතය හේතුවෙන් ගිවිසුම්ගත පරිදි වාණිජ ගොඩනැගිලි කුලිය (ආපනශාලා,ගබඩා) නොලැබීම ප්‍රධාන වශයෙන් හේතුවී ඇති අතර හිඟ ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාල ආයතන ප්‍රධානීන් සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම් දී ඇත. | ඉකුත් වර්ෂවල හිඟ ආදායම අයකර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතු වීම. |
| (i) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයකර නොගත් රු.9,305,100ක මුදල වනජීවී භාරය මගින් පවත්වාගෙන ගිය ආපනශාලාවෙන් අයවිය යුතු කුලී ආදායම වුවද, 2020 දෙසැම්බර් 31 වන විට වනජීවී භාරය ඈවර කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. වනජීවී භාරය සමඟ සෘජුව කටයුතු කර හිඟ මුදල් අයකර ගැනීමට තීරණය කළ බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | හිඟ කුලිය කඩිනමින් අයකර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | අයත් රේඛීය අමාත්‍යාංශ ලේකම්ට 2021.03.09 දිනැති ලිපියෙන් හිඟ කුලිය කඩිනමින් අයකරන ලෙස දැනුම් දී ඇත. | |
| (ii) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ල රාජ්‍ය ආයතන 04 ක් වෙත කුලී පදනම මත ලබාදීමෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයවිය යුතු රු.33,465,869 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අදාල හිඟ මුදල පොත්වලින් ඉවත් කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති අතර රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් දි ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම් දී ඇත. | පසුවිපරම් කර අදාල කටයුතු කඩිනමින් නිම කළ යුතු වීම. |
| (iii) | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.70,862,646 ක අයවිය යුතු ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර තිබුණි. එසේ තිබියදී සමාලෝචිත වර්ෂය තුලදීද රු.45,984,311 ක ශේෂයක් හිඟ හිට තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2019.12.31 ට පෙර සිට පවතින රු.70,862,646 අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. සමාලෝචිත වර්ෂයට අදාල හිඟ ආදායම රු.45,984,311 ක් වීමට, Covid -19 වසංගතය හේතුවෙන් කුලී ආදායම නොලැබීම, ගිවිසුම් පැහැර හැරීම යනාදිය හේතු වී ඇත. | ඉකුත් වර්ෂවල හිඟ ආදායම් අයකර ගැනීම සිදුකල යුතු අතර එම හිඟ ආදායමට අළුතෙන් එකතු වීම් අවම කර ගැනීමට ක්‍රියාමර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | පේෂකර්ම දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට හිඟ කුලිය රු.17,647,250 ක් වූ අතර ප්‍රවර්තන වර්ෂයේ හිඟ කුලිය රු.532,000ක් විය. බදුකරුවන් විසින් ගිවිසුම් පරිදි බදු මුදල් නොගෙවීම හේතුවෙන් මෙම හිඟ මුදල ඇති වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. හිඟ කුලිය සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියා කරන බව පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති අතර 2021 වර්ෂයේදී අදාළ හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟකුලී අයකර ගැනීම සම්බන්ධයෙන් නිතර පසු විපරම් සිදු කර හිඟ කුලී අයකර ගැනීමට කඩිනම් කළ යුතු වීම. |
| **(v)** | නිදන් හා වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබාදී තිබූ රජයේ නිවාසයෙන් 2015 සිට 2020 දක්වා අයකර නොගත් රු.14,798,387 ක හිඟ හිටි ශේෂයක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ හා පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ අංක සීඩී 85 දරණ රජයේ නිවාසය සඳහා අයවිය යුතු කුලිය සම්බන්ධයෙන් නිරන්තරයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙත සිහි කැඳවීම් යොමු කරන ලද අතර සෞඛ්‍ය අමාත්‍යාංශයට එම මුදල කඩිනමින් ගෙවන ලෙස 2021.03.16 දිනැති ලිපිය මඟින්ද දැනුම් දී ඇත. | හිඟකුලී අයකර ගැනීම සම්බන්ධයෙන් නිතර පසු විපරම් සිදු කර හිඟ කුලී අයකර ගැනීමට කඩිනම් කල යුතු වීම. |
| **(vi)** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන් කර තිබූ බංගලා දෙකක් සඳහා 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.36,042,000 ක් ඇතුළුව අමාත්‍යාංශයේ රජයේ බංගලා නිවාස හිඟකුලී ආදායම රු.73,975,601 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී මෙයින් | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට වෙන් කර දී තිබූ **C-**81හා **C-**82 දරණ බංගලා සඳහා රු.36,042,000 ක කුලියෙන් අතීතයට බලපැවැත්වෙන පරිදි තක්සේරුකර අප වෙත එවන | හිඟ බංගලා නිවාස කුලී කඩිනමින් අයකර ගත යුතු වීම. |

| | |
|---|---|
| රු.1,694,344ක් පමණක් අයකර තිබුණි. | ලද වාර්තා පදනම්ව ගණනය කරන ලද හිඟ මුදල වන රු.13,614,000 කඩිනමින් ගෙවීමට එකඟ වූ අතර ඉතිරි මුදල වන රු.22,428,000 වටිනාකම හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. අනෙකුත් හිඟ කුලිය කඩිනමින් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | -------------------------------------- | ---------- |
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කල සම්පූර්ණ ප්‍රතිපාදනයම රු.1,800,000 ක් ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අවශ්‍යතාවය අනුව වියදම් ඇස්තමේන්තු සකස් කරන ලද අතර, 2020 වසරේදී පැවති කොවිඩ් 19 වසංගත තත්වය මත කාර්යාල වසාතැබීම හේතුවෙන් අපේක්ෂිත වියදම් සිදුනොකිරීම මත ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදුවූ අතර, ඉදිරියේදි අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට යටතේ එක් එක් වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 44 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.9,655,210,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු. 8,050,986,785 ක් විය. මෙහිදී උපාධිධාරී අභ්‍යාසලාභීන් 60,000ක් බඳවා ගැනීමට සැලසුම් කලද වර්ෂය තුලදී 45,000ක් පමණක් බඳවා ගැනීම හා සැලසුම් කළ පරිදි වියදම් සිදු නොකිරීම හේතුවෙන් මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු. 1,604,223,214ක් වූ අතර මෙම ඉතිරිවීම් සියයට 15 ක සිට සියයට 98 ක් දක්වා අතර පරාසයක් තුල පැවතිණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. උපාධිධාරී අභ්‍යාසලාභීන් 60000ක් බඳවාගැනීමට සැලසුම් කලද කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වර්ෂය තුලදි, අභ්‍යාසලාභීන් 45000ක් පමණක් බඳවාගැනීම මත අපේක්ෂිත වියදම් සිදු නොකිරීම මත ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වී ඇත. 2021 වසරේදි ඉතිරි බඳවාගැනීම් කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | මු.රෙ.50 අනුව ඇස්තමේන්තු සකස් කල යුතු වීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැරකම් හා බැදීම් ගිණුම් සටහන්වල දැක්විය යුතු වුවද, බැදීම් හා බැරකම් ප්‍රකාශයේ සටහන (iii) යටතේ දැක්විය යුතු මුදල් රෙගුලාසි 14(1) එකඟ වූ බැරකම් වටිනාකම රු.14,832,776ක් වූ අයිතමයන් 83ක් බැදීම් ප්‍රකාශයෙහි (සටහන iv) දක්වා තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. භාණ්ඩ හා සේවා සඳහා එළඹ ඇති බැරකම්වලට අමතරව උපචිත ගිණුම් සකස් කිරීමේ ප්‍රමිතින් අනුව එළඹ ඇති අනෙක් සියලුම බැදීම් හා බැරකම්, බැරකම් ප්‍රකාශයේ දක්වා ඇති බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛය ප්‍රකාර බැදීම් හා බැරකම් නියමිත සටහන්වල ඇතුලත් කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 94 (1) විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.710,174 ක බැරකම් ඇතිකර ගෙන තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. 2020 වසරේ දෙසැම්බර් 31 න් පසු ඉදිරිපත් වන ලද වවුචර් සඳහා පසුව ගෙවීම් කිරීමට සිදුවන ලද බැවින් මු.රෙ.94 විධිවිධාන වලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹ ඇති අතර ඉදිරියේදි මෙම තත්වය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. | මු.රෙ.94(1) ප්‍රකාර ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එලඹීම නොකළ යුතු වීම. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර | අදහස් දක්වා නැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| **(i) 11 වන පරිච්ඡේදයේ 13.5 වගන්තිය** | රාජකාරි ආවරණය කිරීම සඳහා වඩාත් සුදුසු නිළධාරියා පත්කල හැකි වුවත් විගණනය සඳහා ලබා දුන් තොරතුරුවලට අනුව III ශ්‍රේණියේ නිළධාරීන් 68 ක් සඳහා I ශ්‍රේණියේ රාජකාරි ආවරණය කිරීමේ පත්වීම් ලබාදී තිබුණි. | මේ වන විට 1 ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු සිදු කරමින් සිටින බව දන්වමි.<br>සුදුසු නිළධරයෙකු නොමැති වීම හේතුවෙන් අදාල තනතුර තවදුරටත් පුරප්පාඩුව පවතී නම් පහල ශ්‍රේණියක නිළධරයෙකු හට වැඩ බැලීමට /රාජකාරි ඉටු | රාජකාරි ආවරණය කිරීම සඳහා වඩාත් සුදුසු පුද්ගලයා පත් කල යුතු අතර නොපමාව උසස්වීම් ලබාදී පුරප්පාඩු පිරවිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීමට ලබාදී , වසරක් පාසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දීර්ඝ කර ගත යුතු වේ. | |
| **(ii)** | XIX පරිඡේදයේ 7.2 වගන්තිය | රජයේ නිවාසවල බදු කාල සීමාව ඉක්මවා රැඳී සිටින නිලධාරීන්ගෙන් දණ්ඩන කුලියක් අයකර ගතයුතු වුවත් එවැනි නිළධාරීන් 03 දෙනෙකුගෙන් එසේ දඩ අයකිරීම් කර නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ. බදු කාලසීමාව ඉක්මවා පදිංචිව සිටින සියලුම නිලධාරීන්ගෙන් දණ්ඩන කුලී අයකිරීමට කටයුතු කරන අතර, ඒ අනුව මෙම නිලධාරීන් 06 දෙනාගෙන් දණ්ඩන කුලී අයකිරීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදුකෙරෙමින් පවතින බව දන්වා සිටිමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව දණ්ඩන කුලී අයකරගත යුතු වීම. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 891 දරන මුදල් රෙගුලාසිය | ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | ඇප ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | පුරවැසි ප්‍රඥප්තියට අනුකූලව ආයතන විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර නොතිබුණි | 2021 පෙබරවාරි මස 25 දිනට පෙර අංශයට අදාල පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙස 2021.01.26 දින දැනුම් දුන් අතර, මේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර පුරවැසි ප්‍රඥප්තිය පිළියෙල කල යුතු වීම. |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් අධීක්ෂණය කරමින් අදාල කාර්යය අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වා සිටිමි. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු.995,768 ක් හා ද්විතීක පදනම මත මුදාහැර ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.372,184 ක අයවියයුතු ණය ශෙෂයක් අයකරගෙන නොතිබුණි. එම අයවිය යුතු ශේෂයන්ගේ කාල පරාසය වර්ෂ 02 ක සිට වර්ෂ 04 ක් අතර හා වර්ෂ 05 ට වැඩි වශයෙන් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. රු.104,976 ක් වූ ණය ශේෂයකින් කොටසක් අයකර ඇති අතර ඉතිරි ණය මුදල හැකි ඉක්මනින් පියවීමට කටයුතු කරන බව දන්වා ඇත. රු.109,244 ක ණය ශේෂයක් ඇපකරුගෙන් අය කර ගැනීමට ජනාධිපති ලේකම් කාර්යාලය වෙත දැනුම් දී ඇත. එමෙන්ම ද්විතිය පදනම මත මුදාහැර ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු සම්පූර්ණ ණය මුදල අයකර ගැනීමට එම නිලධාරීන් දැනුවත් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බවත්, ඉදිරියේදී එවැනි ද්විතීය පදනම මත මුදා හැරීමට ප්‍රථමයෙන් ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු අතර හිඟ ණය ශේෂයට අළුතෙන් එකතුවීම් අවම කර ගැනීමට පියවර ගත යුතුය. ද්විතීයන පදනම මත නිළධාරීන් මුදා හැරීමේදී ගිණුම් අංශය දැනුවත් කර ණය ශේෂ අයවීම සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

--------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- |
| ජාතික භාෂා සමානාත්මතා ප්‍රවර්ධනය වැඩසටහන **(NLEAP-canadian).** සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් අංක 2509(13) දරන වැය විෂයය යටතේ විදේශ ප්‍රදාන රු.5,300,000 ක් හා ඒ වෙනුවෙන් අංක 2509(17) දරන වැය විෂයය යටතේ දේශීය අරමුදලෙන් වැය කිරීමට රු.1,350,000 ක් වෙන්කර තිබුනද සම්පූර්ණ මුදලම ඉතිරි වීම් ලෙස දක්වා තිබුණි. එසේ වුවද විගණනයට ලබාගත් තොරතුරුවලට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී කැනේඩියන් ඩොලර් 1,991,672 ක් හෙවත් රු. 285,914,474 (2020.12.31- **CAD** 1= රු.143.555) ක් සෘජුව ලැබී තිබුණු අතර එම ලැබීම් භාණ්ඩාගාරය හරහා නොලැබීම හේතුවෙන් ගිණුම් ගත කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. **NLEAP –Canadian** ව්‍යාපෘතිය ජාතික භාෂා අංශයට සම්බන්ධ ව්‍යාපෘතියක් වේ. ජාතික භාෂා අංශය මෙම අමාත්‍යාංශයට ඒකාබද්ධ වීමට පෙර වෙනත් අමාත්‍යාංශයක් යටතේ පවතින වකවානුවේදී මෙම **NLEAP –Canadian** ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර, ගිණුම්ගත කිරීමකින් තොරව පවත්වාගෙන ගොස් ඇති බව නිරීක්ෂණය විය.වැය ශීර්ෂ අංක **130** යටතේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් වුවද, අදාල ප්‍රදාන සිදුකරන රට විසින් සෘජුවම එම ප්‍රදාන ලංකාවේ **NLEAP –Canadian** ව්‍යාපෘති කාර්යාලය වෙතම ලබාදීමක් සිදුකර ඇති අතර, ඒ හේතුවෙන් මහා භාණ්ඩාගාරයේ ගිණුම්ගත වීමක් සිදුවී නැත. මේ වනවිට මෙම අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය විසින් ඒකාබද්ධව මේ සම්බන්ධයෙන් | සෘජු ප්‍රදාන නිවැරදිව ඇස්තමේන්තු කල යුතු අතර සෘජු ප්‍රදාන ලැබීම් නිවැරදි ක්‍රමවේදයන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම |

| | | |
|---|---|---|
| | නිවැරදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. | |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයට අයත් මහියංගනය, පොළොන්නරුව, මිහින්තලය, මුලතිව්, යාපනය, කතරගම හා මොනරාගල නිවාඩු නිකේතන පිහිටි ඉඩම් පවරා ගැනීම හෝ නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවසන් කර නොතිබුණි. | මෙම ඉඩම් පවරා ගැනීමට අදාළව නිවාඩු නිකේතන පිහිටි ඉඩම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතින බැවින්, එම නිවාඩු නිකේතන පිහිටි දිස්ත්‍රික්කයන්ගේ දිස්ත්‍රික් තක්සේරුකරුවන් වෙත මෙම කාර්යය කඩිනම් කරන ලෙස දැන්වීමට කටයුතු කරමින් පවතී.අදාල කටයුතු කඩිනමින් සිදුකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | නිවාඩු නිකේතන පිහිටි ඉඩම් පවරා ගැනීම නොපමාව සිදුකල යුතු වීම. |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිනි ගැනීමට ලක්ව තිබුණු 23A සමුළු නිවස සම්බන්ධයෙන් වර්ෂ 2කට අධික කාලයක් ගතව | 2020.01.23 දිනැතිව පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. එම පරීක්ෂණයට අදාළ වාර්තාව ලබා දෙන | පරීක්ෂණ මණ්ඩලය පත් කර වර්ෂයකටත් වැඩි කාලයක් ගත වී ඇති |

| | | | |
|---|---|---|---|
| | තිබියදීත් මු.රෙ 104(3) හා 104(4) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව හා අවසන් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ලෙස අවස්ථා කිහිපයකදී පරීක්ෂණ මණ්ඩලය වෙත දැනුම් දී ඇතත්, වාර්තාව ලබාදීමේ කටයුතු ප්‍රමාද වන බැවින් කඩිනමින් අදාළ වාර්තාව ලබාදීමට අවශ්‍ය කටයුතු කරන ලෙස 2021.03.30 දිනැතිව නැවත ලිපියක් මඟින් දැනුම් දෙන ලදී. මෙම පරීක්ෂණ වාර්තාව ලද පසු එම ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂිත බව දන්වා සිටිමි. | බැවින් 104(4) ප්‍රකාර අවසන් වාර්තාව ලබාගැනීමට කටයුතු කල යුතු අතර එම වාර්තාව ලබාදීම පරීක්ෂණ මණ්ඩලයේ වගකීම විය යුතු වීම. |
| (ආ) | 2019 මාර්තු 17 දින අනතුරකට ලක්වූ වාහනයක් රු.2,700,000 ක අළුත්වැඩියාව සඳහා භාරදී තිබුණේ මාස 07ක් ගතවීමෙන් පසු එනම් 2019 ඔක්තෝබර් 30 දින දීය. එසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින දක්වාම අළුත්වැඩියාව අවසන් කර අමාත්‍යාංශය වෙත වාහනය භාර දී නොතිබුණි. | නිරීක්ෂණ හා එකඟ වේ.<br>2019 මාර්තු 17 දින සිදු වූ අනතුරට අදාළ අලාභහානි අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු ලබා දෙන ලෙස 2019.04.02 දින එන්. පී මෝටර් ගරාජ් ආයතනය වෙත දැන්වූ අතර එම ආයතනය මඟින් ඇස්තමේන්තු ඉදිරිපත් නොකළ බැවින් 2019.08.07 දින එල්.ආර්.මෝටර්ස් ආයතනය වෙත දැනුම් දෙන ලදී. නමුත් එම ආයතනය මඟින් ඉදිරිපත් කළ ඇස්තමේන්තුව සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල එකඟ නොවූ බැවින් දෙපාර්ශවයේම එකඟතාවය පරිදි 2019.10.30 දින රථය අලුත්වැඩියාව සඳහා ලියනගේ මෝටර්ස් ආයතනය වෙත ලබා දෙන ලදී. එමෙන්ම අලුත්වැඩියාව සඳහා කල්ගත වීම සම්බන්ධයෙන් අදාළ ආයතනයෙන් විමසන ලද අතර අනතුරින් සිදුව ඇති අලාභහානිය විශාල බැවින් අලුත්වැඩියාව සඳහා කාලයක් ගත වන බවත් පවත්නා කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ආයතනයේ වැඩ කටයුතු නතර කිරීමට සිදු වීම හා අමතර | අනතුරුවලදී වාහන අළුත්වැඩියා කිරීම ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතු වීම. |

කොටස් සපයා ගැනීමේ අපහසුතාව හේතු ලෙස දන්වා ඇති බව දන්වා සිටිමි.

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයේ දී පරිපාලන සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලබා, සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කරන ලද නිළධාරියෙකු 2008 වර්ෂයේ දී I ශ්‍රේණියේ තනතුරක රාජකාරි ආවරණය සඳහා පත්කර තිබුණි. මෙම නිලධාරීයා 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කර අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II තනතුරටත් 2018 අප්‍රේල් සිට සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ ජොෂ්ඨ සහකාර ලේකම් (පාලන) තනතුරටත් පත් කර ඇත. ඒ අනුව මෙම නිලධාරියා මුල් පත් විම් දිනයේ සිට මේ දක්වාම වසර 17කට අධික කාලයක් ස්ථාන මාරු විමකින් තොරව සෞඛ්‍ය,පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ සේවය කරනු ලබයි. | නිරීක්ෂණ හා එකඟ වේ. 2003.09.01 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත්වීම් ලද එම්.බී.එල්.රහුමාන් මහතා 2004.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞඛ්‍ය ආරක්ෂණ, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබේ. 2007 වසරේදී එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන හා හදිසි වැටලීම්) තනතුර පුරප්පාඩු වූ අතර I ශ්‍රේණියේ තනතුරක් වූ එම තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම සඳහා සහකාර ලේකම් එම්.බී.එල්.රහුමාන් මහතා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියෙන් පත් කර තිබේ. | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.5 වගන්තියට අනුව රාජකාරි ආවරනය සඳහා වඩාත්ම සුදුසු පුද්ගලයෙකු පත් කල යුතු වීම. |
| (ආ) | 2007 නොවැම්බර් 02 දින සිට 2010 ජූලි 20 දක්වා 8A දරන නිවසේ කිසිවෙකු රැඳී සිට නොමැති කාලය | කිසිවකු පදිංචිව නොසිටි කාලසීමාවක් සඳහා, ගණනය කර ඇති මෙම මුදල පිළිබඳව නැවත | අදාල ගැටලුව කඩිනමින් නිරවුල් කල යුතු වීම. |

| | | |
|---|---|---|
| සඳහා රු. 228,976 ක විදුලි බිලක් ලැබීම සම්බන්ධයෙන් වූ තත්ත්වය මෙතෙක් නිරවුල් කර නොතිබුණි | පරීක්ෂා කර නිවැරදි වාර්තාවක් යොමු කරන ලෙස 2017.11.07 දින ලංකා විදුලිබල මණ්ඩලය වෙත දැනුම් දී ඇති අතර මේ වන තෙක් අදාල වාර්තාව මෙම අමාත්‍යාංශය වෙත ලබාදීමට කටයුතු කර නොමැති බැවින්, සිහිකැඳවීමේ ලිපියක් යොමුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 173 ක් පැවතියද එයින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක් දරන්නාට පෞද්ගලික වන සේ ලබාදුන් තනතුරු විය. ඒ අනුව පුරප්පාඩු 171 ක් පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා උසස්වීම් මගින් සුදුසුකම් ලබන නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ කටයුතු සහ බඳවා ගැනීම් සම්බන්ධ කටයුතු අදාල සේවා අංශ මගින් සිදු කරනු ලැබේ. | පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කළමණාකරන සහකාර සේවයේ අතිරික්ත සංඛ්‍යාව 24 ක් වූයෙන් එම තනතුරු සංඛ්‍යාව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජනාධිපති කාර්යාලයෙන් අනුයුක්ත කරන ලද නිලධාරීන් සඳහා රජයේ පත්වීම් ලබාදීමට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තනතුරු අනුමත කර ගැනීමට නියමිතය. | අතිරික්ත තනතුරු සංඛ්‍යාව අනුමත කරගත යුතු වීම. |